**ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය නොකළ මතය**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන් නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල

සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

  මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම සමග ඉදිරිපත් කරන ලද අක්මුදල් සැලැස්ම අනුව වර්ෂය සඳහා මිලියන 107.68 ක් ඉල්ලුම් කිරීමට සැලසුම් කර තිබුණ ද 2019 මැයි 15 දින විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එම ප්‍රමාණය රු.මිලියන 79.906 කි. ඒ අනුව එම සැලසුම් අතර වෙනසට හේතු නිරීක්ෂණය නොවූ අතර වර්ෂය සඳහා රු.මිලියන 87.81 ක් ඉල්ලුම් කර තිබුණි. ඒ අනුව අවශ්‍ය අග්‍රිම මුදල නිසි පරිදි ඇස්තමේන්තු කර නොමැති බව නිරීක්ෂණය වූ අතර භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තුවට ඉල්ලුම් කරන ලද මුළු අග්‍රිම මුදලම නිකුත් කර තිබුණි. | අවශ්‍ය අග්‍රිම ප්‍රමාණය තාත්වික ලෙස සැලසුම් කිරීමට කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂය සඳහා 2017.12.22 දිනැතිව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට යවා ඇති වාර්ෂික අක්මුදල් අයදුම් පත්‍රයේ සඳහන් අගයන්ම, ක්‍රියාකාරි සැලැස්මේ ද , 2019.05.15 විගණනයට ඉදිරිපත් කරන ලද ලිපියේද අන්තර්ගත වේ. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 7 ක් හා සියයට 16 ක් වී තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල කිරීමට කටයුතු කිරීම හා පරිපූරක ඇස්තමේන්තු වලින් ප්‍රතිපාදන වෙන්කර ගැනීමේ දී අවශ්‍යතාවයට ගැලපෙන පරිදි කටයුතු කළ යුතු වීම. | ඇතැම් පුනරාවර්තන වැය විෂයන් සඳහා ලබා ගත් ප්‍රතිපාදන වලින් වැඩි ප්‍රතිශතයක් අපේක්ෂා කළ පරිදි වියදම් දැරීම සිදු විය. නමුත්, මූලධන වැය විෂයන් සඳහා ලබා ගත් ප්‍රතිපාදන අපේක්ෂා කළ පරිදි වියදම් දැරීමට සිදු නොවුන නිසා එම වැය විෂයන්ගේ ප්‍රතිපාදන පුනරාවර්ථන වැය විෂයට සාපේක්ෂව ඉතිරි වීමක් සිදු විය. |
| (ආ) | වැය විෂයයන් දෙකක් සඳහා 2018 වර්ෂයේ වාර්ෂික | | ගෙවීම සඳහා නිකුත් කල යුතු ගෙවීම් සහතිකය ඉදිරිපත් කිරීමට |

| | | |
|---|---|---|
| ඇස්තමේන්තුවෙන් වෙන්කරන ලද රු.500,000 ක ප්‍රතිපාදනයට අමතරව එම ඇස්තමේන්තුව මෙන් සියයට 2,944 ක පරිපූරක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණ ද එයින් සියයට 76 ක් ඉතිරි වී තිබුණි. තවත් වැය විෂයයක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර පරිපූරක ඇස්තමේන්තු මගින් රු.4,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද එයින් සියයට 81 ක් ඉතිරි වී තිබුණි. | අවශ්‍යතාවය සලකා බලා පරිපූරක ප්‍රතිපාදන සලසා ගත යුතු වීම | ප්‍රමාද වීම හේතුවෙන් හා විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය සකස් කිරීමේදී සියළුම මාදිලි (Module) සකස් කර අවසන් වන තුරු ගෙවීම් සිදු කල නොහැකි වීම මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත |

**2.3** බැරකම් හා බැඳීම්වලට එළඹීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | එකතුව රු.342,017 ක් බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණු අතර වැය විෂයයන් 02 ක් සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා රු.341,770 ක බැරකම් වලට බැඳී තිබුණි | බැරකම් නිසි පරිදි ගිණුම් තැබීමට හා බැරකම් සඳහා බැඳීම් ඇතිකර ගැනීමේ දී අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදාල සීමාව ඉක්මවා බැරකම් ඇතුලත් කල නොහැකි බැවින් CIGAS පද්ධතියට ඇතුලත් කිරිමට හැකියාව ඇති බැරකම් පමණක් බැරකම් ප්‍රකාශයේ සටහන් කරන ලදී. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) | මුදල් රෙගුලාසි 340 (1) | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් රජයේ සියළු දෙපාර්තමේන්තු වලට ප්‍රමාණවත් වූ උප පත්‍රිකා පොත් තබා ගෙන නොමැති බවත්, ඇතැම් අවස්ථාවන් වලදී මුද්‍රණ දෙපාර්තමේන්තුවේදීම කුවිතාන්සි පොත් නිකුත් කරන බවත් නිරීක්ෂණය විය. | රජයේ සියලුම දෙපාර්තමේන්තුවල අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි ප්‍රමාණවත් උප පත්‍රිකා පොත් පවත්වාගෙන යාම සඳහා විධිවිධාන යෙදවීම | පොදු 172 කුවිතාන්සි පොත් වල අවශ්‍යතාවය රජයේ මුද්‍රණාලයාධිපතිට දන්වා ඇති අතර වසර පුරා කලින් කලට එම පොත් ලබා ගෙන අඛණ්ඩව බෙදා හැරීමට කටයුතු කර ඇත. |
| (ආ) | මුදල් රෙගුලාසි 316 හා 317 | මුදල් රෙගුලාසි වලට පටහැනි ලෙස උපපත්‍රිකා පොත් එක අගුලක් සහිත කුඩා කාමරයක විවෘතව තැන්පත් කර ඇති බවත්, එම ස්ථානයේදී ම රජයේ ආයතන වලින් පැමිණෙන නිලධාරීන්ට නිකුත් කරන බවත්, උපපත්‍රිකා පොත් පිළිබඳ ලිපි ගණුදෙනු සිදුකරන බාහිර පුද්ගලයින් එම කාමරයට ඇතුළු වන බවත් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව උප පත්‍රිකා පොත් සඳහා ආරක්ෂාව සැලසීම සඳහා විධිමත් ක්‍රමවේද සකස් කිරීම | පොදු 172 පොත් සම්බන්ධයෙන් ආරක්ෂාව පිළිබඳ ඉහළින්ම කටයුතු කර ඇති අතර ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඒ සඳහා එක් කාමරයක් වෙන් කර ඇත. එම කාමරයේ මුල් යතුර හා එහි අනු යතුර වගකිව යුතු නිලධාරීන් 02 දෙනකුට භාර දී ඇත. |
| (ඇ) | මුදල් රෙගුලාසි 343 | 2018 ඔක්තෝබර් 11 දින රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන තිබුණු කුවිතාන්සි පොත් තුල කුවිතාන්සි 12 ක් ඇතුළත් වී | පෙර වර්ෂවල සිට මේ දක්වා කුවිතාන්සි පොත් හා කුවිතාන්සි පිටු නැතිවීම සිදුවන | මෙහි ඇතැම් අංක නොතිබීම රජයේ මුද්‍රණාලයේ මුද්‍රණ කටයුතු වල සිදුවූ වැරදි හා |

| | | |
|---|---|---|
| නොතිබුණු බව නිරීක්ෂණය විය. | බැවින් එවැන්නක් යලිදු ඇතිවීම වැළැක්වීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම හා නැතිවීම් සම්බන්ධව අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම. | නොසැලකිලිමත්කම හේතුවෙන් සිදු වූවකි. එහෙත් මෙම දෝෂ සහිත පොත් අප වෙත නිකුත් කිරීමේදී ඒවායේ අංක අස්ථාන ගතවී ඇති බවට අප හට ප්‍රකාශකොට එම පොත් ලබා දී ඇත. මෙසේ ප්‍රකාශකරමින් අප විසින්ද අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු වලටද මේ අයුරින් පොත් බෙදා දී ඇත. එම නිසා මෙම දෙපාර්තමේන්තුවේ පාර්ශවයෙන් හානියක් හෝ අයථා ක්‍රියාවක් සිදුවී නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා පත්කල කමිටුව විසින් වසා දැමීමට අනුමැතිය දෙන ලද අරමුදල් 13 සම්බන්ධයෙන් 2018 අගෝස්තු 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2018 ප්‍රකාරව කටයුතු කල යුතු වුවත් ,අරමුදල් 02 ක මුදල් ශේෂයන් පමණක් ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණු අතර අරමුදල් 04 ක් සම්බන්ධයෙන් රැස්වීම් පැවැත්වීම පමණක් සිදු කර තිබුණි. | මෙම අරමුදල් 13 වසා දැමීමට අවශ්‍ය පියවර කඩිනමින් ගැනීම හා එම අරමුදල් වලට අදාල ව්‍යවස්ථා වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. | අරමුදල් සමාලෝචන කමිටු වාර්තාවේ සඳහන් අරමුදල් 13 වසා දැමීමට අදාළව රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2018 නිකුත් කර ඇති අතර එම චක්‍රලේඛය ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් කටයුතු සිදු කරනු ලැබුවේද යන්න සම්බන්ධ පසු විපරම් කිරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලදී. |
| (ආ) | 2015 මැයි 19 දිනෙන් පසු කාලපරිච්ඡේදයට අදාල භාණ්ඩාගාර සටහන් 06 ක් නිසි පරිදි නිකුත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට හා ගණන්දීමේ නිලධාරීන්ට අදාල භාණ්ඩාගාර සටහන් ඉදිරි මුදල් කටයුතු වලදී මාර්ගෝපදේශකත්වයෙහිලා සැලකීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය | භාණ්ඩාගාර සටහන් නිසි පරිදි නිකුත් කිරීමට අවශ්‍ය පියවර විධිමත් පියවර ගත යුතු වීම. | ප්‍රකාශනමාලා අංක 240 හා 356 හි පළකරන ලද නිරීක්ෂණ හා සමාන බැවින් ප්‍රකාශනමාලා 376හි නිරීක්ෂණ සම්බන්ධයෙන් වෙනම භාණ්ඩාගාර සටහන් සකස් කර නොමැති අතර . ප්‍රකාශනමාලා 04 ක් සම්බන්ධයෙන් භාණ්ඩාගාර සටහන් කෙටුම්පත් කර මුද්‍රනය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |

**3.2 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආයතන සම්බන්ධයෙන් එකතුව රු.මිලියන 422.99 ක් වූ කපා හැරීම් හා අත්හැරීම් සඳහා අනුමැතිය ලබා දී තිබුණද යම් නිශ්චිත දිනකදී කපා හැරීම් හා අත්හැරීම් සඳහා අනුමැතිය ලබා දීම පිළිබඳව පරීක්ෂා කිරීමට මධ්‍යගත ලේඛනයක් හෝ දත්ත පද්ධතියක් නොමැති බව නිරීක්ෂණය විය. | මධ්‍යගත ලේඛනයක් හෝ දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. | වාර්ත තබා ගැනීම සඳහා මධ්‍යගත ලේඛනයක් / දත්ත පද්ධතියක් තබා ගැනීමට මේ වන විට කටයුතු කර ඇති බව දන්වා සිටිමි. |
| (ආ) | 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී පාඩු හා කපා හැරීම් වටිනාකම රු.මිලියන 375.57 කින් වැඩි වී තිබුණු අතර එය 2018 වර්ෂයට සාපේක්ෂව සියයට 792 ක වැඩි වීමක් විය. | පාඩු හා කපා හැරීම් ශේෂයන් කඩිනමින් නිරවුල් කළ යුතු වීම | එකග වෙමි. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඒ යටතේ වූ දර්ශක ප්‍රධාන කර ගනිමින් අදාල අරමුණු හා දර්ශක හඳුනා ගැනීම හා ළඟා කර ගැනීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කළ යුතු වුවද එම අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | තිරසර අරමුණු ඉටුකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. | මෙම දෙපාර්තමේන්තුව විසින් මහා පරිමාණ ලෙස සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු නොලබන අතර අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කටයුතු වලට අදාළ ව ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ වලට ගරු මුදල් ඇමති තුමාගේ නිරීක්ෂණ සකස් කිරීම තුලින් තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා දායක වනු ලැබේ. |